ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2016 ජුනි මස 07 වැනි දින |

## 2016 පෙබරවාරි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

වෙළඳ හිඟය අඩු වීම සහ සංචාරක ඉපැයීම් හා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලෙස වූ විදේශ විනිමය ලැබීම්වල වර්ධනයක් වාර්තා වීම හේතුවෙන් 2016 පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වයක් පෙන්වීය. අපනයන ආදායමෙහි සිදු වූ අඩු වීම හමුවේ වුවද ඉන්ධන ආනයන, ආහාර හා පාන සහ ප්‍රවාහන උපකරණ ආනයන වියදමෙහි සිදු වූ විශාල අඩු වීම හේතුවෙන් වෙළඳ හිඟය අඩු විය. කෙසේ නමුත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

**අපනයන ක්‍රියාකාරිත්වය**

ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල අඩුවීම පිළිබිඹු කරමින් 2016 පෙබරවාරි මාසයේ දී අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 888 ක් දක්වා සියයට 1.7 කින් අඩු විය. මෙම අඩු වීම සඳහා විශාලතම දායකත්වය ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනයෙන් ලැබුණු අතර අනතුරුව මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ කුළුබඩු මෙම අඩු වීම සඳහා දායක විය. නැව් හා ගුවන් යානා ඉන්ධන අපනයන පරිමාව මෙන්ම සාමාන්‍ය අපනයන මිල යන දෙකෙහිම අඩු වීම් පිළිබිඹු කරමින් 2016 පෙබරවාරි මාසයේ දී ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 55.6 කින් අඩු විය. සියලුම උප කාණ්ඩයන්ගේ අපනයනවල අඩු වීම් වාර්තා කරමින් 2016 පෙබරවාරි මාසයේ දී මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම සියයට 33.2 ක අඩු

වීමක් පෙන්වීය. ඒ අතර, කුළුබඩු අපනයන ආදායම සියයට 34.8 කින් අඩු වූ අතර, කරාබුනැටි, ගම්මිරිස් සහ සාදික්කා අපනයන පරිමාවන්හි අඩු වීම් ඒ සඳහා හේතු විය. තේ සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායම් අඩු වීම ද සමස්ත අපනයන ආදායම අඩු වීම සඳහා සැලකිය යුතු ලෙස දායක විය. 2016 පෙබරවාරි මාසයේ දී තේ සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායම පිළිවෙළින් සියයට 6.8 කින් සහ සියයට 10.7 කින් අඩු වූ අතර, ජාත්‍යන්තර ඉල්ලුම අඩු වීම සහ මිල ගණන් අඩු වීම මේ සඳහා හේතු විය. එසේ වුවද, සමස්ත අපනයනයෙන් සියයට 52 ක් පමණ වන රෙදිපිළි හා ඇඟලුම් අපනයනය මෙම මාසයේ දී සියයට 10.3 කින් වර්ධනය වූ අතර, එය, සමස්ත අපනයනයේ සිදු වූ අඩු වීම යම්තාක් දුරකට සීමා කිරීමට උපකාරී විය. 2016 පෙබරවාරි මාසයේ දී යුරෝපා සංගමයට සහ එක්සත් ජනපදය වෙත  සිදු කළ ඇඟලුම් අපනයන පිළිවෙළින් සියයට 11.7 කින් සහ සියයට 8.7 කින් වර්ධනය විය.

සමුච්චිත වශයෙන් සැලකූ විට 2016 පළමු මාස දෙක තුළ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,783 ක් දක්වා සියයට 2.0 කින් අඩු විය. 2016 පළමු මාස දෙක තුළ දී, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජර්මනිය, ඉන්දියාව සහ ඉතාලිය ප්‍රධාන අපනයන වෙළඳපොළ වූ අතර, මෙම වෙළඳපොළ වෙත සිදු කළ අපනයන මුළු අපනයනයෙන් සියයට 54  ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම

| කාණ්ඩය | 2015 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2016 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **695.1** | **701.4** | **0.9** | **1,405.7** | **1,413.9** | **0.6** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 20.9 | 30.4 | 45.6 | 42.1 | 52.4 | 24.6 |
| රෙදිපිළි හා ඇඟලුම් | 419.9 | 463.1 | 10.3 | 829.7 | 927.5 | 11.8 |
| රබර් නිෂ්පාදිත | 67.5 | 60.2 | (10.7) | 131.7 | 131.5 | (0.1) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 36.9 | 24.7 | (33.2) | 81.3 | 55.3 | (32.0) |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 26.5 | 24.5 | (7.5) | 53.7 | 45.2 | (15.9) |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 41.6 | 18.5 | (55.6) | 102.8 | 47.1 | (54.2) |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 10.8 | 12.1 | 12.1 | 26.1 | 24.4 | (6.6) |
| වෙනත් | 71.0 | 67.9 | (4.4) | 138.4 | 130.6 | (5.6) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **202.9** | **182.1** | **(10.2)** | **404.8** | **361.6** | **(10.7)** |
| තේ | 108.4 | 101.0 | (6.8) | 221.9 | 200.4 | (9.7) |
| රබර් | 2.5 | 3.3 | 28.9 | 4.9 | 6.7 | 36.3 |
| කුළුබඩු | 30.9 | 20.1 | (34.8) | 62.0 | 42.9 | (30.8) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 14.1 | 9.3 | (34.1) | 26.7 | 18.8 | (29.3) |
| මුහුදු ආහාර | 11.2 | 14.7 | 32.2 | 27.7 | 30.0 | 8.0 |
| සකස් නොකළ දුම්කොළ | 2.6 | 3.1 | 21.4 | 6.4 | 5.9 | (8.7) |
| වෙනත් | 33.2 | 30.6 | (8.0) | 55.2 | 56.9 | 3.0 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **5.1** | **4.2** | **(18.1)** | **9.1** | **7.1** | **(22.2)** |
| **මුළු අපනයන** | **903.0** | **887.7** | **(1.7)** | **1,819.7** | **1,782.6** | **(2.0)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

**ආනයන ක්‍රියාකාරිත්වය**

පසුගිය මාස හත තුළ පෙර වසරේ අදාළ මාසයන්ට සාපේක්ෂව පැවැති ආනයන වියදම අඩු වීමේ ප්‍රවණතාවය තවදුරටත් අඛණ්ඩව පැවතෙමින් 2016 පෙබරවාරි මාසයේ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,439 ක් දක්වා 2015 පෙබරවාරි මාසයට සාපේක්ෂව සියයට 5.9 කින් පහත වැටුණි. 2015 පෙබරවාරි මාසයේ දී එ.ජ.ඩොලර් 69.52 ක් ලෙස වාර්තා වූ බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල 2016 පෙබරවාරි මාසයේ දී එ.ජ.ඩොලර් 35.36 ක් දක්වා අඩු වීම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 149 ක් දක්වා සියයට 43.7 කින් අඩු වීම, මෙම පහත වැටීම සඳහා විශාල ලෙස දායක විය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් තාප විදුලිබල උත්පාදනය ඉහළ යෑම හේතුවෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාවන් ඉහළ ගියේය. 2015 වසරේ දී ලැබුණු සරු වී අස්වනු හේතුවෙන් 2015 මැයි මාසයේ සිට නිරීක්ෂණය වූ සහල් ආනයන අඩු වීමේ ප්‍රවණතාවය තවදුරටත් අඛණ්ඩව පැවැති අතර 2016 පෙබරවාරි මාසයේ දී සහල් ආනයන වියදම 2015 වසරේ අනුරූප මාසයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 18 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 0.7 ක් දක්වා පහත වැටුණි. මීට අමතරව, 2016 පෙබරවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පිළිවෙළින් සියයට 24.9 ක් සහ සියයට 10.4 ක් ලෙස සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වුවද, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදම මාසය තුළ දී සියයට 21.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.


සමුච්චිත වශයෙන් සැලකූ විට, 2016 වසරේ පළමු මාස දෙක තුළ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 3,028 ක් දක්වා සියයට 5.7 කින් පහත වැටුණු අතර, ඉන්ධන ආනයන වියදම පහළ යෑම මේ සඳහා හේතු විය. 2016 වසරේ පළමු මාස දෙක තුළ දී චීනය, ඉන්දියාව, ජපානය, සිංගප්පූරුව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ අතර මෙම රටවල් වෙතින් සිදු කළ ආනයන සමස්ත ආනයනයන්ගෙන් සියයට 56 ක් පමණ විය.


# සංඛ්‍යා සටහන 2: ආනයන වියදම

| කාණ්ඩය | 2015 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2016 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **352.5** | **345.6** | **(2.0)** | **749.8** | **689.1** | **(8.1)** |
| ආහාර හා පානවර්ග | 145.9 | 122.6 | (16.0) | 315.5 | 241.2 | (23.5) |
| එළවළු | 35.5 | 37.5 | 5.8 | 73.4 | 81.8 | 11.5 |
| සීනි සහ රසකැවිලි | 23.8 | 18.3 | (22.9) | 43.0 | 27.9 | (35.1) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 19.3 | 1.3 | (93.3) | 75.7 | 3.1 | (95.9) |
| මුහුදු ආහාර | 16.4 | 19.3 | 17.2 | 29.0 | 35.2 | 21.3 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 51.0 | 46.1 | (9.5) | 94.3 | 93.1 | (1.3) |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 206.5 | 223.0 | 8.0 | 434.3 | 447.9 | 3.1 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 33.5 | 42.3 | 26.3 | 70.1 | 83.8 | 19.6 |
| වාහන | 58.8 | 64.5 | 9.8 | 158.2 | 151.4 | (4.3) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 114.3 | 116.1 | 1.6 | 206.0 | 212.6 | 3.2 |
| **2. අන්තර් භාණ්ඩ** | **814.3** | **724.0** | **(11.1)** | **1,656.0** | **1,525.2** | **(7.9)** |
| ඉන්ධන | 264.4 | 148.8 | (43.7) | 553.6 | 323.6 | (41.5) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 211.1 | 225.0 | 6.6 | 411.1 | 475.9 | 15.8 |
| තිරිඟු හා ඉරිඟු | 3.1 | 10.2 | 229.5 | 24.4 | 53.2 | 118.1 |
| දියමන්ති සහ අගනා ගල් හා ලෝහ වර්ග | 19.5 | 38.9 | 98.8 | 26.1 | 63.6 | 143.7 |
| මූල ලෝහ | 32.9 | 26.2 | (20.3) | 82.4 | 57.1 | (30.7) |
| වෙනත් | 283.3 | 274.9 | (3.0) | 558.4 | 551.8 | (1.2) |
| **3. ආයෝජන භාණ්ඩ** | **362.3** | **369.4** | **2.0** | **804.2** | **813.4** | **1.1** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 173.4 | 210.2 | 21.2 | 414.0 | 465.7 | 12.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 118.1 | 105.9 | (10.4) | 227.3 | 240.8 | 6.0 |
| ප්‍රවාහන උපකරණ | 70.3 | 52.8 | (24.9) | 161.5 | 105.4 | (34.8) |
| වෙනත් | 0.4 | 0.5 | 32.0 | 1.4 | 1.4 | 3.2 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.4** | **0.3** | **(25.4)** | **1.3** | **0.8** | **(35.8)** |
| **මුළු ආනයන** | **1,529.5** | **1,439.3** | **(5.9)** | **3,211.2** | **3,028.4** | **(5.7)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

### රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය




**වෙළඳ ශේෂය**

අපනයනවල වූ පහළ යෑමට සාපේක්ෂව ආනයන සැලකිය යුතු ලෙස පහත වැටීම හේතුවෙන් 2016 පෙබරවාරි මාසයේ දී වෙළඳ ශේෂයේ හිඟය එ.ජ.ඩොලර් මිලියන 552 ක් දක්වා සියයට 11.9 කින් අඩු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එ.ජ.ඩොලර් මිලියන 1,391 ක් වූ වෙළඳ හිඟය 2016 වසරේ පළමු මාස දෙක තුළ දී එ.ජ.ඩොලර් මිලියන 1,246 ක් දක්වා සියයට 10.5 කින් පහත වැටුණි.

**සංචාරක ඉපැයීම්**

2016 මාර්තු මාසයේ දී 192,841 ක පැමිණීම් සංඛ්‍යාවක් සමඟින් සංචාරක පැමිණීම් සියයට 22.8 ක හිතකර වර්ධනයක් වාර්තා කළේය. 2016 වසරේ පළමු කාර්තුවේ දී සමුච්චිත පදනම මත වූ සංචාරක පැමිණීම් 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී සියයට 22.1 කින් වර්ධනය විය. 2016 වසරේ පළමු කාර්තුවේ දී චීනය සහ ඉන්දියාව පිළිවෙළින් සියයට 46.6 ක හා සියයට 32.2 ක වර්ධනයක් වාර්තා කරමින් සංචාරක පැමිණීම්හි ප්‍රමුඛස්ථානය ගත් අතර, කලාපීය ආර්ථික හා දේශපාලනික අර්බුද හමුවේ වුවද යුරෝපය සහ මැද පෙරදිග කලාප වෙතින් වූ සංචාරක පැමිණීම් පිළිවෙළින් සියයට 20.6 කින් සහ සියයට 13.7 කින් අඛණ්ඩව වර්ධනය විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් මිලියන 969.3 දක්වා සියයට 22.1 කින් වර්ධනය විය[1].

---

1 සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2016 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2016 පෙබරවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 554.2 දක්වා සියයට 8.3 කින් වර්ධනය විය. 2015 පෙබරවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පහත වැටීම මෙම වර්ධනයට යම් ප්‍රමාණයකට හේතු විය. වර්තමානයේ පවත්නා අඩු තෙල් මිල සහ එමගින් මැදපෙරදිග රටවල ආදායම අඩු මට්ටමක පැවතීම මගින් අඛණ්ඩව විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් මත සෘණාත්මක බලපෑම් ඇති වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

**මූල්‍ය ලැබීම්**

2016 වසරේ පළමු මාස තුන තුළ දී, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 15.4 ක ශුද්ධ ගෙවීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 572.3 ක සමුච්චිත ගෙවීමක් සමඟ අඛණ්ඩව විදේශීය ආයෝජනවල ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. 2016 මාර්තු මස අග දක්වා කොළඹ කොටස් වෙළඳපොළ එ.ජ.ඩොලර් මිලියන 12.5 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර එය, ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ විදේශීය ආයෝජනවල එ.ජ.ඩොලර් මිලියන 13.8 ක ගෙවීමකින් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 1.3 ක ලැබීමකින් සමන්විත විය. 2016 පෙබරවාරි මාසයේ දී රජය වෙත වූ දිගුකාලීන ණය 2015 පෙබරවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 6.4 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 9.6 ක ශුද්ධ ගෙවීමක් විය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2016 පෙබරවාරි මාසයේ දී සමස්ත ගෙවුම් තුලනය 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 692 ක හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 534 ක හිඟයක් වාර්තා කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2016 පෙබරවාරි මස අග වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ආනයනික මාස 4.2 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 6.6 ක් වූ අතර මුළු විදේශීය වත්කම් ආනයනික මාස 5.5 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 8.5 ක් විය.

2016 ජුනි මස 06 වන දින වන විට ශ්‍රී ලංකා රුපියල, එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 1.3 කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව 2016 ජුනි මස 06 වන දින වන විට ශ්‍රී ලංකා රුපියල ස්ටර්ලින් පවුමට (සියයට 1.7 කින්) එරෙහිව අධිප්‍රමාණය වූ අතර ඕස්ට්‍රේලියානු ඩොලරයට (සියයට 1.6 කින්), ජපන් යෙන්වලට (සියයට 12.5 කින්) සහ යුරෝවලට එරෙහිව (සියයට 4.9 කින්) එරෙහිව අවප්‍රමාණය විය.

**සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2015 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2016 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 903.0 | 887.7 | -1.7 | 1,819.7 | 1,782.6 | -2.0 |
| ආනයන | 1,529.5 | 1,439.3 | -5.9 | 3,211.2 | 3,028.4 | -5.7 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+)/හිඟය (-)) | -626.5 | -551.7 | -11.9 | -1,391.5 | -1,245.8 | -10.5 |
| සංචාරක ඉපැයීම් | 274.4(ආ) | 327.7 | 19.4 | 533.3 | 649.7 | 21.8 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 511.6 | 554.2 | 8.3 | 1,035.2 | 1,117.6 | 8.0 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 27.2 | 8.8 | -67.7 | 28.1 | -10.1 | -136.0 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 166.4 | 52.6 | -68.4 | 365.8 | 141.5 | -61.3 |
| එයින්, | | | | | | |
| භාණ්ඩාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 109.2 | 9.7 | -91.1 | 190.4 | 23.0 | -87.9 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | - | - | - |
| දිගුකාලීන ණය | 54.2 | 42.7 | -21.2 | 158.2 | 113.8 | -28.0 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.